# සාන්ත නිකලස් තුමා

## රතු කබායකින් සැරසි පිනි මුවන් බැඳි කරත්තයේ නැගි එන මිනිසා පිළිබඳ සත්‍ය කථාව

ෂෙරිල් ඕඩන් විසින් රචනා කරන ලදි
R.F පලව්විනි විසින් චිත්‍රයට නඟන ලදි



# The Story of St. Nicholas

## Sinhalese Edition

Copyright 2015 Voice Media

info@VM1.global
Web home: www.VM1.global

All rights reserved. No part of the publication may be reproduced, distributed or transmitted in any form or by any means, including photocopying, recording, or other electronic, or mechanical methods, without the prior written permission of the publisher, except in the case of brief quotations embodied in critical reviews and certain other noncommercial uses permitted by copyright law. For permission requests, email the publisher, addressed "Attention: Permission Coordinator," at the address above.

This publication **may not be sold, and is for free distribution** only.

# සාන්ත නිකලස් තුමා

## රතු කබායකින් සැරසි පිනි මුවන් බැඳි කරත්තයේ නැගී එන මිනිසා පිළිබඳ සත්‍ය කථාව

ෂෙරිල් ඕඩන් විසින් රචනා කරන ලදී
R.F පලව්චිනි විසින් චිත්‍රයට නඟන ලදී

"ද වොයිස් ඔෆ් ද මාටර්ස්" යනු ලාභ නොලබන කිතුනු ආයතනයකි. කොමියුනිස්ට් වාදීන්, මුස්ලිම් සහ අනෙකුත් ජාතීන්ගේ විරුද්ධවාදිකම් නිසා පීඩාවට පත් වී සිටින කිතුනුවන්ට උපකාර කිරීම සඳහා එය ක්‍රියාත්මක වේ. VOM සේවාව රිචඩ් සහ සබිනා වර්ම්බ්‍රෑන්ඩ් විසින් 1967 දී ආරම්භ කරන ලදී.

ඔවුහු කොමියුනිස්ට්වාදී රුමෙනියාවේ බිංගෙවල් තුළ පැවැත්වූ සභාවන් හා සම්බන්ධව කටයුතු කළ නිසා සිරගත වූහ. එම සේවය නිසා ඔවුන්ගේ හදවත් තුළ ලෝකය පිළිබඳව දර්ශනයක් ඇති විය. ඒ තුළින් පීඩාවට ලක්වූ සභාවන් දැනුවත් කිරීම සහ ධෛර්යමත් කිරීම සඳහා කාර්යාල රැසක් ආරම්භ විය.
ඒ මඟින් තම කිතුනු සාක්ෂිය නිසා වදහිංසාවට ලක්වූ කිතුනුවන්ට සහන සැලසීමට හැකිවී ඇත.

පීඩාවට පත්ව තිබෙන සභාවන් හට උපකාර කිරීමට ඔබ කැමත්තක් දක්වන්නේ නම් පහත සඳහන් ලිපිනය ඔස්සේ අප අමතන්න.

ශ්‍රී ලංකා ජාතික ධර්මදූත සන්ධානය
නො 32
එබනීසර් පෙදෙස
දෙහිවල
දු.ක. අංකය 0115 512337
විද්‍යුත් තැපෑල : missions@nceasl.org





ඒන්ස්ලි සහ චානී වෙත
නිකලස් තුමාගේ පරිත්‍යාගශීලී සහ නොසැලෙන
ඇදහිල්ල ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් නැඟී සිටීම
සඳහා ඔබ හට පෙළඹවීමක් ඇති වේවා !

*ආදරණීය අම්මා.*

නිකලස් තුමා මෙන් යේසුස්වහන්සේ වෙනුවෙන් නැඟී
සිටීම නිසා මරණයට සහ සිර අඩස්සියට පත්වීමේ
අවදානමට හසුවී පීඩාවට ලක්වූ අපගේම
සහෝදරයන් වෙනුවෙනි.

# දෙමාපියන්ට සහ දෙගුරුන්ට කතෘතුමාගෙන් පණිවිඩයක්.

නත්තල් සැඳෑවේ රතු කබායකින් සැරසී පිනිමුවන් බැඳි කරත්තය පදවාගෙන පැමිණ හොඳ ළමුන් හට තෑගි බෝග බෙදන තරබාරු මිනිසා "නත්තල් සීයා" ලෙස අපි හඳුන්වමු. ඔහු මයිරාවේ ශාන්ත නිකලස් තුමා වන අතර එතුමාගේ ජීවිත කථාව සම්බන්ධව පුරාවෘත ගණනාවක් ඉතිහාසයෙහි සඳහන්ව ඇත.

නමුත් "නත්තල් සීයා" යන මිථ්‍යා නාමය පිටුපස සිටින ඒ මිනිසා කවුද?

ක්‍රි.ව. 3 වන සියවසයේදී රෝම අධිරාජ්‍යයේ ලයිසියා නම් ප්‍රාන්තයෙහි මයිරාවේ නිකලස් තුමා උපත ලැබීය. පුරාණ ලයිසියාව වර්තමානයේ තුර්කිය ලෙස හඳුන්වනු ලැබේ. ක්‍රි.ව. 343 වර්ෂයේ දෙසැම්බර් 06 වෙනි දින ඔහු මෙලොවින් සමුගත් අතර ජර්මනිය ස්විට්සර්ලන්තය සහ නෙදර්ලන්තය වැනි රටවල්හි ජීවත් වන ජනයා එම දිනය "ශාන්ත නිකලස් දිනය" ලෙස සමරති. නිදසුනක් ලෙස ජර්මනියේ අය සෑම දෙසැම්බර් මස 06 වැනි දිනකම එතුමාව සැමරීම සඳහා "Nikalaus Stiefel" ලෙස සඳහන් කරන ලද සපත්තුවක් තම නිවසේ ප්‍රධාන දොර ඉදිරිපස එල්ලා තබති. ඔවුන් එසේ කරන්නේ තමන් හොඳ ළමුන් යයි සිතා ශාන්ත නිකලස් තුමා ඔවුන්ට තෑගි බෝග පුරවා තබයි යන අපේක්ෂාව ඇතිවය. එහෙත් ඔවුන් නපුරු ළමුන් යැයි එතුමාට හැඟුණොත් ඔවුන්ට ලැබෙන්නේ අඟුරු ගොඩක් පමණි.

සැබෑ නිකලස් පරිත්‍යාගශීලි අචල විශ්වාසයකින් හෙබි මිනිසෙක් විය. තම ධනවත් මව්පියන් මිය යාමෙන් පසු එම සියලු වස්තුව නිකලස්ට හිමිවූ අතර තමාට ලැබුණු ධනයෙන් අසරණයන්ට පිහිට වීමට ඔහු ප්‍රිය කළේය. නිදසුනක් ලෙස මෙම පොතේ එක් පිටක වීථියේ සිටි සහෝදරියන් තිදෙනෙකු නිකලස් තුමාගේ එම සත් ක්‍රියාව නිසා දිවි ගළවාගත් ආකාරය විස්තර කර තිබේ. ඔවුන් විවාහ කරදීම සඳහා දෑවැද්දක් දීමට අපොහොසත් වූ එම පියාට තම දියණියන් ගණිකා මඩමකට විකිණීම හැරෙන්නට වෙන තෝරාගැනීමක් නොවීය. එය පිළිබඳව දැනගත් නිකලස් තුමා ඔවුන් සිටි කාමරයට රන් මලු කිපයක් දැම්මේය. තම දියණියන්ට මෙම අනර්ග ත්‍යාගය අත්කර දුන් මෙම අභිරහස් පුද්ගලයා නිසා ඔවුන්ගේ පියාගේ සිත ප්‍රීතියෙන් පිනා ගියේය. රහසේ පෙනී සිටි නිකලස් තුමා ඔහුට රත්තරන් දුන් බව කාටවත් නොපවසන ලෙස ඉල්ලා සිටියේය.

සාගතයක් පැමිණි විට රට පාලනය කළ නිළධාරින්ගේ දූෂිත ක්‍රියා කලාපයන් නිකලස් තුමා විසින් නොබියව හෙළිදරව් කරන ලද බව වාර්තා වේ. ඉල්ලුම් වැඩිවීමට සලස්වා මිළගණන් ඉහළ යැවීමේ අරමුණකින් ධාන්‍ය තොග සඟවා තැබූ ආණ්ඩුකාරයාගේ රැවටිලි සහගත ක්‍රියා පිළිවෙත ඔහු ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළේය. ඉන් පසුව වංක මනුෂ්‍යයෙකු වූ එම ආණ්ඩුකාරයා විසින්ම නිර්දෝෂී මනුෂ්‍යයන් තුන් දෙනෙකු හට නිකරුනේ වරද තබා අත්අඩංගුවට ගනු ලැබුවේය. නිකලස් තුමා ඔවුන් වෙනුවෙන් ද මැදිහත් වී කටයුතු කළේය. ඉන් එක් සිරකරුවෙකු හිස ගසා මරණයට පත්කිරීමට නියමිත ස්ථානයේ සිටියදී එම අලුගෝසුවාගෙන් කඩුව උදුරාගෙන එම මනුෂ්‍යයන් තිදෙනාට නිදහස ලබා දුන් ආකාරය එහි තවදුරටත් සඳහන් වේ. ඔව්හු ඔහුගේ නිර්භීත කම ගැන ප්‍රශංසා කළෝය.

එසේ වුවත් නිකලස් තුමාගේ ධර්මිෂ්ඨ ක්‍රියාවන් පිළිබඳව විවිධ කථාන්තර බොහෝ දෙනෙකු විසින් හොඳින් දන්නා අතර ඔහුට ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් විඳින්නට සිදුවූ දුක් ගැහැට පිළිබඳව දන්නේ ස්වල්ප දෙනෙක් පමණි. ඩියෝක්ලිසියන් නම් වූ රෝම අධිරාජයා තම පාලන කාලය තුළ කිතුනුවන්ට විරුද්ධව භයානක පීඩාවන් දියත් කළේය. එකල ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේ බව ප්‍රකාශ නොකිරීම තරයේ ප්‍රතික්ෂේප කළ නිසා නිකලස් තුමාද සිරගෙදර තුළ දරුණු ශාරීරක වද හිංසාවන්ට ලක් විය. (රත්වූ යකඩ අඬු වලින් පුළුස්සන ලදි.) සෑම සිරමැදිරියක්ම කිතුනු නායකයන්ගෙන් පිරී ගිය නිසා සැබෑ අපරාධ කරුවන් සිරකර තැබීමට ඉඩ පහසු කම් නොතිබුණු බව එක් ලියවිල්ලක සඳහන් වී තිබේ.

පීඩාව අවසන් වූ වහාම ඔහුගේ ඇදහිල්ල සභාව තුළින් පැමිණි ගිනිමය පරීක්ෂාවලින් සෝදිසි කිරීමට භාජනය විය. "ආරියුස්" නම් එක්තරා දේශකයෙකු විසින් මිථ්‍යා මතයක් ප්‍රකාශ කරමින් යේසුස්වහන්සේ මිනිසෙකු බවත් උන් වහන්-සේ මාංශවත්වූ දෙවියන් වහන්සේ නොවන බවත් කියා සිටියේය. ආරියුස් තවදුරටත් තම මිථ්‍යා ඉගැන්වීම් එම යුගයේ තිබූ ජනප්‍රිය සංගීත සහ ගීත තනු උපයෝගී කරගෙන ඉදිරිපත් කළේය. කොන්ස්තන්තිනු නම් නව අධිරාජයා විසින් සෑම සභානායකයෙක්ම "නයිසියාවට" කැඳවා ආරියුස්ගේ මෙම ඉගැන්වීම් සහ තවත් සභාව දෙකඩවීමට බලපෑ හේතු කීපයක් පිළිබඳව සාකච්ඡාවක් කැඳවන ලදී. මෙය නයිසියා මන්ත්‍රණ සභාව ලෙස හඳුන්වනු ලබයි. ඉතිහාසයේ සඳහන්ව ඇති පරිදි ආරියුස් විසින් එම සභාව ඉදිරියේ තම මතය යේසුස් ක්‍රිස්තුස් වහන්සේට අවමන් කරමින් ගීතයක් ආකාරයට ගායනා කරන්නට විය. ක්‍රිස්තුස් වහන්සේට පරිහාස කිරීමට ප්‍රිය නොකළ නිකලස් තුමා ක්ෂණිකව නැඟී සිට ඔහුගේ මුඛයට වැරෙන් පහරක් එල්ල කළ අතර එතැන රැස්ව සිටි පිරිස එය තුළින් තිගැස්සී සිටියහ. ක්‍රිස්තුස් වහන්සේගේ මහිමය වෙනුවෙන් නැඟී සිටීමට ඔහුට අවශ්‍ය වූ බව එතැන සිටි පිරිසට අවබෝධ වූ නමුත් තමාගේ සතුරාට පවා ප්‍රේමය දක්වමින් සාමයෙන් පිරී ජීවිතයක් ගත කළ යුතු බව ක්‍රිස්තුස් වහන්සේ උගන්වා ඇති නිසා මෙවැනි හැසිරීමකට ඉඩ නොදිය යුතු බව ඔවුහු විශ්වාස කළෝය. එම නිසා තව දුරටත් නිකලස් තුමාට බිෂොප් ධුරයේ සිටීමට නොහැකි විය. (ඔහුව නැවතත් එම ධුරයට පත්කළ බව සඳහන්ව ඇත.) නමුත් එයින් දුගියන්ට සහ රෝගීන්ට ඔහු කළ සේවය අවසන් නොවිණි.

කිතුනුවන්ට එරෙහිව තිබූ පීඩාවන් නිකලස් තුමාගේ කාලයට පමණක් සීමා නොවිය. නිවැරදි දේ තෝරාගෙන එය කිරීමට යොමු වූ පුද්ගලයන් සහ දෙවියන් වහන්සේ අනුගමනය කළ පුද්ගලයන් ආරම්භයේ සිටම පීඩාවන්ට ලක් විය. සමාජවාදී සහ මුස්ලිම් රටවල්හි වෙසෙන කිතුනුවෝ ක්‍රිස්තුස් වහන්සේ පිළිගැනීම සහ උන් වහන්සේ පිළිබඳව සාක්ෂි දැරීම නිසා අද දිනයේදී ද බොහෝ පීඩාවන්ට මුහුණ දෙති. බොහෝ සමාජවාදී රටවල්හි නිවෙස් තුළ රැස්වී බයිබලය අධ්‍යයනය කිරීම නීති විරෝධී යයි සලකන අතර බයිබලයක් ළඟ තබාගැනීම නීතියේ රැහැනට හසුවී වසර ගණනාවක් හිර කරුවෙකු බවට පත්වීමට හේතුවක් වී ඇත. මුස්ලිම් දේශයන්හිදී කිතුනුවෙකු බව යමෙක් හඳුනා ගතහොත් ඔහුව පවුලෙන් කොන්කිරීමට හෝ විදි අසල අන්තවාදී මුස්ලිම් වරුන්ගේ වෙඩි පහරකට ලක් වීමට ද සිදුවේ.

අද දිනයේ පීඩාවට පත්වන කිතුනුවෝ බොහෝ සෙයින් මයිරාවේ නිකලස් තුමාට සමාන වෙති. ඔවුන් තමන්ගේ රටේ නායකයන්ට නිහතමානිව සේවය කරමින් ක්‍රිස්තුස් වහන්සේ සමඟ සිරගතවීම සහ ක්‍රිස්තුස් වහන්සේ නොමැතිව සිරගත නොවී සිටීම යන තීරණයේදී ධෛර්යමත්ව දෙවියන් වහන්සේ තුළ නැඟී සිටිති. නිර්භීත කම සහ පරිත්‍යාගශීලි බවින් යුතු එතුමාගේ ජීවිත කථාව දේශපාලනික වශයෙන් පීඩාවට මුහුණ දෙන්නාවූ සහ සභාව සමඟ ගැටුම් ඇතිකර ගන්නාවූ සැමටම මහඟු ආදර්ශයකි. සමස්ත කිතුනුවන්ගේ තීරණයට අනුව ඔහු සැබවින්ම සාන්තු වරයෙකි.

මයිරාවේ නිකලස් තුමාගේ ජීවිත කථාව අප සැමට පරිත්‍යාගශීලිව ජීවත්වීමටත් දිළිඳුන්ට සේවය කිරීමටත් අභියෝගයක් වී ක්‍රිස්තුස් වහන්සේට සහ උන් වහන්සේගේ දරුවන්ට සංස්කෘතිය තුළින් නැගී එන පීඩාවන් හමුවේ ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් සිට ගැනීමට මහත් ධෛර්යයක් වේවා.


“අපි ඔහුට නිකලස්
කියා නම තබමු”



ඒකමත් එක කාලෙක යේසුස්වහන්සේ ඉපදිලා අවුරුදු 200කට විතර පස්සේ ලිසියාවේ ධනවත්, සල්ලිකාර දෙමාපියන්ට දාව පුංචි පුතෙක් ඉපදුණා.

ඔහුට නිකලස් කියා නම් තබමු යැයි එකඟ වූ ඔව්හු තමන්ගේ මුළු හදවතින් ඔහුට ආදරය කළා.

නමුත් නිකලස් කුඩා කාලෙම ඔහුගේ දෙමාපියන් මිය ගියා. ඒ නිසා ඔවුන්ගේ ධනය සියල්ලම ඔහුට හිමිවුණා.

“මම මේ ධනය දිළිඳු අයට උපකාර කිරිමට පාවිච්චි කරමි”යි තිරණය කළ නිකලස් එම ධනය අවශ්‍යතා වලින් පෙලෙන අයට දීමට පටන් ගත්තේය.





“මම මේවා දිළිඳු අයට
උපකාර කිරීමට
පාවිච්චි කරමි”



විවාහ කර දීමට සුදුසු වයසේ දූවරු තිදෙනෙකු සිටින පියෙක් මුදල් නොමැති කම නිසා ඔවුන්ට සුදුසු ස්වාමි පුරුෂයන් සොයා දීමට නොහැකිව ලත වෙන බව නිකලස් තුමාට දැනගන්නට ලැබිණ.

"මං මොනවා කරන්නද? අනේ මං වගේ කාලකන්නි පියෙක්. මට මගේ දූවරුන් ලස්සනට විවාහ කරදීමට පුළුවන් කමක් නැහැනෙ යැයි පවසා පියා හැඬුවේය. කරන්නට කිසිවක් නොමැති වූ පියා දූවරුන් මහ මඟ ජීවත්වෙන්නට ඉඩ හැරියේය.


මං මොනවා කරන්නද?
අනේ මං වගේ
කාලකන්නි පියෙක් !

මේ දිළිඳු පියාගේ ප්‍රශ්නය නිකලස් තුමාගේ කණට වැටුණි. “මං මේ මනුෂ්‍යාට උදව් කරන්නේ කොහොමද?” නිකලස් තුමා සිතන්නට විය.

ඉන්පසු මුළු නගරයම නිදා සිටියදී එක දිගටම රාත්‍රී තුනක් තරුණ නිකලස් තුමා දිළිඳු මිනිසාගේ නිවසට රහසින් ගොස් රන්මසු මල්ලක් බැගින් දියණියන්ගේ කාමර වලට දැම්මේය. සෑම රාත්‍රියකම රන්මසු මල්ල පොළවේ ගැවෙන විට “සිලිංබිලිං” යන හඬක් නැඟිය.







"මම ඔබට කළ දේ කිසිවෙකුට කියන්න එපා" යැයි නිකලස් තුමා ඔවුනට පැවසුවේය.



සෑම රාත්‍රියකම මේ හඬ පියා සහ ඔහුගේ දියණියන් තිදෙනා අවදි කළේය. තුන්වෙනි දින රාත්‍රියේ රහසින් දන්දෙන්නා මුණගැසෙන පිණිස පියා අවදිව සිටියේය.

“සිලිංබිලිං” හඬ ඇසෙනවා සමඟම ඔවුන්ගේ පියා මෙම රහසිගත පුද්ගලයාව අල්ලා ගත් අතර ඔහු තරුණයෙක් බව අවබෝධ කරගත්තේය. “මා ඔබට කළ දේ කිසිවෙකුට කියන්න එපා” යැයි තරුණයා ආයාචනා කළේය. පියා මේ බව කාටවත් නොකියන්න පොරොන්දු විය. තමුන්ගේ දියණියන් තිදෙනාට අත්වී තිබූ දුක්ඛිත තත්ත්වයෙන් ඔවුන් බේරාගෙන ඔවුන්ට සුදුසු යහපත් ස්වාමි පුරුෂයන් සොයා දෙන්නට නිකලස් තුමා නිසා හැකිවීම ගැන ඔහු ප්‍රීතියෙන් ගි ගැයුවේය.



කුඩා කාලයේ සිටම නිකලස් තුමා දේව වචනයට ආදරය කළේය.

දිනක් ඔහු ශුද්ධ වූ දේශයේ සංචාරය කොට කියවා තිබූ ස්ථාන නැරඹීමට තීරණය කළේය. ඔහු යේසුතුමා ඉපදුණ බෙත්ලෙහෙමට ගියේය. එතුමා මරණින් නැගිටුණු හිස් සොහොන වෙත ගිය ඔහු එහිදී යාච්ඤා කළේය. යේසුතුමා සැබවින්ම එම්මානුවෙල්ය. දෙවිඳාණෝ අප සමඟය, මම වෙනස් වුණෙමි". යැයි නිකලස් තුමා ශබ්ද නගා පැවසුවේය.


“මම
වෙනස් වුණෙමි”

ඔහු නැවතත් තම මව්බිමට යා යුතු දිනය ඉක්මනින් උදාවිය. ඔහු නැවට ගොඩවූ අතර ඔහු හා කණ්ඩායම ලූසියාව දක්වා යන දිගු මුහුදු ගමන ආරම්භ විය. එක් රාත්‍රියක මහා සුළඟක් හමා රළ පෙරළෙන්නට පටන් ගත් බැවින් නිකලස් තුමා තද නින්දෙන් අවදි විය.

"අප කරදරයට පත්වෙලා. ආරක්ෂා සහිතව වෙරළට ළඟාවීමට හැකි වේ යැයි මා සිතන්නේ නැහැ". කපිතාන් තුමා අනතුරු ඇඟවූයේය. මේ ඇසූ නිකලස් තුමා පැද්දෙන නැවේ දණ නමා යාච්ඤා කළේය. "ආදරණීය යේසුස්වහන්ස, අප සුරක්ෂිතව වෙරළට ගෙන යන්න. වෙරළට ගෙන ගිය පසු ඔබ තුමාට ස්තුති කිරීමට මම පොරොන්දු වෙමි. මුහුද නිශ්චල විය. නැව නැවතත් සුපුරුදු ලෙස මයිරා නුවර දෙසට යාත්‍රා කළේය. "යාච්ඤාව නිසා අපි ආරක්ෂා වුණෙමු" යැයි සෙනඟ ප්‍රීති ඝෝෂා කළෝය.





"ප්‍රේමණීය යේසුස් වහන්ස ! ආරක්ෂා සහිතව ගොඩබිම වෙත යාමට අපට උපකාර කළ මැනව. අප ගොඩබිමට ලඟා වූ සැණින් ඔබට ස්තුති පූජාවක් ඔප්පු කිරීමට මම පොරොන්දු වෙමි"



නැව ආශ්චර්යමත් ලෙස මයිරා වරායට සේන්දු විය. නැවෙන් ඉක්මනින් බැසගත් නිකලස් තුමා ළඟම ඇති දේවස්ථානයට දිව ගියේය.

දේවස්ථානයේ අල්තාරය ළඟට ගිය ඔහු “දෙවියනි, මුහුදු කුණාටුවේදි අපගේ ජීවිත බේරාගත් නිසා ඔබවහන්සේට ස්තුතියි!” යනුවෙන් බොහෝ සතුටින් පැවසු අතර දේවස්ථානයේ නායකයන්ද එම සිදුවීම දුටුවෝය. දෙවිඳුන්ට ස්තුති දිමට වු පොරොන්දුව තම ජීවිතයේ විශාල වෙනසක් සිදු කරනු ඇතැයි ඔහු දැන සිටියේ නැත.


“දෙවිඳුනි, මුහුදු කුණාටුවේ
දි අපගේ ජීවිත බේරාගත්
නිසා ඔබවහන්සේට ස්තුතියි.”





නිකලස් තුමාගේ නැව වරායට පැමිණීමට පෙර රාත්‍රියේ මයිරාවේ මීළඟ බිෂොප් තුමා විය යුත්තේ කවුදැයි තීරණය කිරීමට සභා නායකයින්ට නොහැකි විය.

මේ පිළිබඳ බොහෝ වේලා කථා බහ කළ ඔවුහු, මීළඟ නායකයා තේරීම දෙවිඳුන්ට භාර දෙමු, හෙට දින පළමුව දේවස්ථානයේ දොරටුවෙන් ඇතුළු වන තැනැත්තා මයිරාවේ මීළඟ බිෂොප් තුමා වුණාවේ"යැයි තීරණය කළෝය. එසේ පළමුව පැමිණි පුද්ගලයා නිකලස් තුමා විය. තවමත් අල්තාරය ඉදිරියේ දණ නමා සිටින නිකලස් තුමා වෙතට ගිය සභා නායකයන් ඔහුට මෙසේ පැවසුවෝය. "ඔබ මයිරාවේ මීළඟ බිෂොප් වන්න".

ඩයෝක්ලිසියන් නමැති නපුරු අධිරාජයෙක් රෝමයේ සිටියේය. ඔහු කිතුනුවන් නරක මිනිසුන් ලෙස සිතුවේය.

දේව වචනය හෝ දෙවිඳුන් ගැන හෝ යේසුස්වහන්සේ ගැන හෝ ලියවුණු පොත්පත් ළඟ තබා ගැනීම දඬුවම් ලැබිය හැකි වරදක් බවට ප්‍රකාශ කෙරිණි. කාගේ හරි ගෙදරක දේව වචනය තිබී හසුවුණොත් එය ගින්නට දැමීමට අණ කෙරිණි. බොහෝ කිතුනුවෝ ජීවනයේ වචනය ගින්නෙන් අළුවෙනවා කණගාටුවෙන් බලා සිටියෝය. සමහර කිතුනුවන් සිර ගෙදරට යැවුවෝය.




“ගින්නට දමාපල්ලා”


“සිරගෙට දමාපල්ලා”



සිරගෙට දැමීමේ තර්ජන මැද වුව ද නිකලස් තුමා දුප්පතුන්ට උපකාර කළේය.

එහෙත් යේසුස්වහන්සේට ඔහුගේ ඇති ආදරය බොහෝ ඉක්මනින් රෝම නිළධාරීහු දැනගත්තෝය. ඔවුහු ඔහු අල්ලා හිරගෙට දැමීමට නියෝග කළහ. ඉන්පසු ඔවුහු නිකලස් තුමා අල්ලා සිරගෙට දැමුවෝය.



නිකලස් රඳවා සිටි අඳුරින් වැසි තිබූ ශීතල සිරකුටිය වෙතට ආරක්ෂක සොල්දදුවෝ පැමිණියෝය. සිර කුටියේ දෙර විවෘත වූ ශබ්දය තමා නිදහස ලබන දිනය පිළිබඳව බලාපොරොත්තුවක් නිකලස් තුළ ඇති කළේ ය.

එහෙත් නිමේශයකින් කෲර සොල්දදුවන් වේදනාවට පත්ව තිබූ නිකලස් තුමාගේ ශරීරය වටා රොක් විය. ඔවුන්ගේ දරුණු මුහුණු දුටු නිකලස් තුමාට සිදුවීමට යන දේ පිළිබඳව අවබෝධ විය. "ඔබ අධිරජුට නමස්කාර කර නිදහස් වනවාද? නැත්නම් දෙවියන් වහන්සේට නමස්කාර කරමින් මෙම සිර මැදිරිය තුළම සිටිනවාද?" ආරක්ෂක සොල්දදුවන් රළු හඬින් මොර ගැසුවේය. නමුත් නපුරු අධිරජුට නමස්කාරකිරිම ඔහු දිගින් දිගටම ප්‍රතික්ෂේප කළ නිසා සිර මැදිරියේ යකඩ කූරු පිටුපස දරුණු ලෙස පීඩා විඳිමින් දීර්ඝ කාලයක් ජීවත් වීමට ඔහුට සිදු විය




“සියලුම කිතුනු සිරකරුවන්
නිදහස් කරනු”
කොන්ස්තන්තිනු
අධිරජු නියෝග කළේය.



නපුරු දියෝක්ලිසියන් අධිරජු මිය යෑමෙන් පසු අළුත් අධිරජ කෙනෙක් සිංහාසනාරූඪ විය.

ඔහුගේ නම කොන්ස්තන්තිනු වූ අතර ඔහු යේසුස් වහන්සේට ප්‍රේම කරන මනුෂ්‍යයෙක් විය. එක් දිනක් “සිරගත කර සිටින සෑම කිතුනුවෙකුම නිදහස් කරනු” යනුවෙන් ආඥාවක් නිකුත් කළේය. නිකලස් ද එම දිනයේදි නිදහස ලැබූ නමුත් ඔහුට විඳීමට සිදුවූ කරදර එයින් අවසන් නොවීය.

සභා නායකයෙකු වූ ඒරියස් ක්‍රිස්තුස් වහන්සේ මිනිස් වෙසින් පොළවට වැඩිය දෙවියන් වහන්සේ නොවන බව උගන්වන්ට පටන් ගත්තේය. ඉතා නපුරු මිනිසෙකු වූ ඒරියස් යේසුස් වහන්සේගේ නාමයට කවටකම් කරමින් ගීත රචනා කළේය. ඒවායේ තනු මිනිසුන්ගේ සිත් ඇදගත් අතර වැඩපළේදි, පාසලේදි, වීදි අසලදි සහ සභාවේදි ගායනා කිරීමට හැකිවන පරිදි ඔහු ඒවායේ තනු ද සකස් කළේය. එම ගීත ඉතා ජනප්‍රිය විය.






SPQR
“අපේ ස්වාමින් වහන්සේව ලැජ්ජාවට පත් කිරීමට ඔබ නිර්භීත වුණේ කෙසේද?”



මෙම ගීත බොහෝ කිතුනුවන් යේසුස් වහන්සේගෙන් වෙන් කිරීමට හේතු විය. කොන්ස්තන්තිනු අධිරාජයා විසින් රෝම අධිරාජ්‍ය තුළ සිටින සෑම සභා නායකයෙක්ම රැස්කර සාකච්ජා කිරීමට තිරණය කරන ලදි.

ඒරියස් සහ නිකලස් දෙදෙනාම රැස්වීමට සහභාගි විය. ඒරියස් හනිකට තම අපහාසාත්මක ගීතය ගායනා කළේය. ඒරියස් විසින් යෙසුස් වහන්සේට කළ කවටකම් පිළිබඳව නිකලස් දැඩි ලෙස කනස්සලු විය. ක්ෂණිකව නැඟී සිටි ඔහු ඒරියස්ගේ මුහුණ හරහා පහරක් එල්ල කළ අතර “අප ස්වාමින් වහන්සේ ලැජ්ජාවට පත් කිරීමට ඔබ නිර්භිත වූයේ කෙසේද?” යනුවෙන් මොර ගසා විමසුවේය.



## සභා නායකවරු තිගැස්සිණි!

ඒරියස් විසින් ඔවුන්ගේ ගැළවුම් කරුවාණන්ට අපහාස කළ බව ඔවුන්ට වැටහුණත් කිතුනුවන් සාමකාමී ජීවිතයක් ගත කළ යුතු බව ඔවුහු දැන සිටියෝය. එම නිසා “ඔබට තව දුරටත් දේශනා කිරීමට අවසර දිය නොහැකියි” යනුවෙන් ඔවුහු නිකලස්ට පැවසූහ.


“ඔබට තවදුරටත් දේශනා කිරිමට අවසර දිය නොහැකියි”

මාව බිෂොප් තනතුරෙන් පහ කරනු ලැබුවද, මයිරාවේ නිකලස් අනාථ කඳවුරු ආරම්භ කිරීම, රෝගීන්ට සාත්තු කිරීම සහ දුප්පතුන්ට සැලකීම වැනි දේ නොකඩවා කළේය.

ඔහු තමාගේ අවසන් හුස්ම පිටවන තුරු සෑම විටම පරිත්‍යාගශීලිව ජීවත් වුණේය.









**පි** නිමුවන් බැඳි කරත්තයක රතු කබායකින් සැරසී යහපත් දරු දැරියන්ට නත්තල් සැන්දෑවේදි තෑගි බෝග පිළිගන්වන නත්තල් සීයා පිළිබඳව කියැවුණු පුරාවෘත තුළ සියවස් ගණනාවක් ජීවත් වූ මයිරාවේ නිකලස් තුමාගේ ජීවිත කථාව සැඟවී තිබුණි. එය එසේ සැඟවී තිබුණේ අප විසින් එය අවබෝධ කරගන්නා පිණිසය.

නෙදර්ලන්තය තුළ ඔහුව "සින්ටර්ක්ලාස්" ලෙස හඳුන්වන අතර ඉතාලි ජාතිකයෝ "බැබූ නටාලි" යන නමින් ඔහුව හඳුන්වයි. එහෙත් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා නොසැලී සිටගැනීම විනා තම ගැළවුම් කරුවූ ස්වාමින්ට පිටුපෑම තරයේ ප්‍රතික්ෂේප කරමින් උන් වහන්සේ වෙනුවෙන් පීඩා විඳි මයිරාවේ නිකලස් තුමා අපට අමතක කළ නොහැක.





නි

නිකලස් තුමා මෙන් බන්ධනාගාරවල දිවිගෙවන බොහෝ කිතුනුවන් සිටින රටවල් අද දිනයේ ද තිබේ.

චීනයේ සිටින බොහෝ කිතුනුවන්ට වර්තමානයේ යේසුස් වහන්සේ පිළිබඳව ඉගෙන ගැනීමට අවස්ථාවක් නොමැත. බයිබලය සමඟ අත්අඩංගුවට පත්වූ කිතුනුවෝ සවුදි අරාබි දේශයේ සිරමැදිරි තුළ දිවි ගෙවති. සිර අඩස්සියට පත්වීම සහ ප්‍රතික්ෂේප කිරීමට හසුවී ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් ජීවත්වන මෙම කිතුනුවන්ගේ ජීවිත නිකලස් තුමා කළාක් මෙන් නිර්භීතව ක්‍රිස්තුස් වහන්සේ ගැන අන් අයට පැවසීමට අපව ධෛර්යමත් කරයි





බොහෝ දෙනෙකුට මයිරාවේ ජීවත් වූ මිනිසාගේ කථාව මතකයේ ඇත. ලොව වටා විසිරී දිවිගෙවන ගණන් කළ නොහැකි තරම් වූ කිතුනුවෝ අද දිනයේදී ද ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් නැගී සිටිති. එම කිතුනුවන් මෙන් අපද මෙවර ක්‍රිස්තු උත්පත්තිය සිහිකරන මොහාතේ දි නත්තල් සියා පිළිබඳව කියැවෙන මෙම සත්‍ය කථාන්තරද සිහිපත් කරමු.

පරිත්‍යාගශිලි වීමට සහ වීර්යයෙන් දිවි ගෙවීමට එයින් අපට විශාල ධෛර්යයක් ලැබෙනු ඇත.



## මෙනෙහිකිරීම සඳහා

"එසේය, ක්‍රිස්තුස් වහන්සේ තුළ භක්තිවන්ත ලෙස ජීවත්වන්න කැමති සියල්ලෝම පීඩා විඳින්නෝය"

2 තිමොති 3 : 12

යහපත් ජීවිතයක් ගතකිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
යහපත් ජීවිතයක් ගතකිරීම නිසා එක් පුද්ගලයෙකු පීඩාවට පත්වූයේ ඇයි?

මයිරාවේ නිකලස් තුමා යහපත් මිනිසෙකු ලෙස සලකනු ලැබීමට හේතු මොනවාද?

යහපත් මිනිසෙකු වීම නිසා නිකලස් තුමාට පීඩා විඳීමට සිදුවූයේ ඇයි?

රැකියාවේදී, පාසැලේදී සහ නිවසේදී ඔබගේ ජීවිතයෙන් දෙවියන් වහන්සේගේ චරිත ලක්ෂණ පෙන්නුම් කළ හැක්කේ කෙසේ ද?

### යාච්ඤාව

ස්වාමිනි, සාක්ෂිදැරීමේ වලාටැඹක් ලෙස යහපත්කම සහ විශ්වාසවන්ත භාවය අනුව යමින් නිකලස් තුමා අප වෙත පෙන්වූ ඒ අනර්ඝ ආදර්ශය නිසා ඔබට ස්තුති පුදමු. මගේ ජීවිතයෙන් ඔබගේ චරිතය ප්‍රකාශ කර අන් අය ඔබ වෙත ගෙන එනු පිණිස මට ඔබේ මාර්ගයන් පෙන්නුව මැනව. ඔබගේ නාමය නිසා නොයෙක් දේශයන්හි පීඩා විඳින ඇදිහිලිවතුන් ධෛර්යමත් කළ මැනව, ශක්තිමත් කළමැනව..

ආමෙන්

"ක්‍රිස්තුස් වහන්සේ පාවාදීම තරයේ ප්‍රතික්ෂේප කළ
නොසැලෙන භක්තිවන්ත මිනිසෙකු වූ මයිරාවෙහි නිකල
හෙවත් සාන්ත නිකලස් තුමාගේ ජීවිත කථාව ප්‍රබන්ධ
ජනප්‍රවාදයක් වූ නත්තල් සීයාගේ කථාන්තරය ලෙස
ඉතිහාසයෙහි වලදමා ඇත."

*- නත්තල් සීයා*

*හෙවත් සාන්ත නිකලස් තුමා -*

x 113
ala

The
of the M

Bar